# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි අවසාන වසර පරීක්ෂණය - 2018/2019

## සංගීත පීඨය

## සෞන්දර්ය විද්‍යාව හා විචාරය

## MUML 41022

කාලය :- පැ 03

සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සමන්විත වේ.
- ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ලැබේ. (ලකුණු 20 බැගින්)

1. සුන්දරත්වය නමැති ගුණය, සාම්‍යය නොහොත් සුසංයෝගය නමැති සංකල්පය සමග ඇත්තේ අත්‍යන්ත සබඳතාවකි. සෞන්දර්යය පිළිබඳ ඇති නිර්වචන ඇසුරින් විමසන්න.

2. හොඳ කලා නිර්මාණයක් සර්වකාලීන විශ්වීය අගයකින් යුක්ත වේ. නිදහස් මානවවාදයේ එන මූලික පිළිගැනීම පිළිබඳ ඔබගේ විචාරය කුමක්ද? පැහැදිලි කරන්න.

3. සම්භාව්‍ය මාක්ස්වාදය තුළ සංස්කෘතිය යනු (උපරිව්‍යුහය) දේශපාලන ආර්ථිකයෙන් (අධෝව්‍යුහය) පරායත්ත වූවකි. මේ ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස පැහැදිලි කරන්න.

4. භරතමුනි විසින් දක්වනු ලබන රස අට (08) සර්ව කලීන විශ්ව මානව සත්‍යයක් ලෙස සැලකිය හැකිද? ඔබේ විචාරය ඉදිරිපත් කරන්න

5. ෆර්ඩිනන් ඩී. සෝෂියර් විසින් විස්තර කරනු ලබන වාග් විද්‍යාත්මක සංඥාවේ ප්‍රධාන ලක්ෂණ දෙක (හිතුවක්කාරී බව හා කාලය තුළ පැවතීම) පිළිබඳ ඔබේ පැහැදිලි කිරීම කුමක් ද?

6. “ගස” නමැති වචනයට වඩා ගසක ඡායාරූපයක් හිතුවක්කාරී බවින් අඩු සංඥාවක් වේ. චාල්ස් සැන්ඩර්ස් පියර්ස්ගේ අදහස් ඇසුරින් පැහැදිලි කරන්න.

::::::::::::::::::::::::::::::

2021.11.01